**ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ-1(**i**)) හි සඳහන් ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.29,386,888 ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.29,585,628 ක් ලෙස දක්වා තිබීමෙන් හිඟ ආදායම් ආරම්භක ශේෂය රු.198,740 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉකුත් වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කළ දිනට පසුවද**,** හිඟ ආදායම් වාර්තා ලැබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට එම අගය ගලපා ඇති බවත්, මුද්‍රණ දෝෂයක් මත සිංහල භාෂාවෙන් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනයේ සටහන් වී නොමැති බවත් දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක හා අවසාන ශේෂ නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු ය. |

**(ආ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගැනීම් රු.28,908,475 ක් ලෙස දක්වා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදීගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් රු.42**,**496**,**196 ක් ලෙස දක්වා | ඒසීඒ**-6** හි මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය එකතු කිරීම් රු.13,474,615 ක් 2021 වර්ෂයේ 254-1-1-2103 හා 254-1-2-2103 වැය ශීර්ෂවලින් පරිගණක මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන තැන්පතු ලෙස පොදු තැන්පතු ගිණුමේ රඳවන ලද මුදලක් වන අතර**,** එම මුදල**,** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ තැන්පතු ගෙවීම් ලෙස සටහන් | නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.13,587,696 කින් වැඩියෙන් දක්වා තිබුණි. එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම සඳහා වූ රු.11,643,451 ක් හා හැකියා වර්ධනය සඳහා වූ රු.1,944,245 කින් සමන්විත විය. | කර ඇත.<br>මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව භෞතික වත්කම් මිලදීගැනීම් හෝ ඉදිකිරීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වන රු.42,496,196 හා ඒසීඒ-6 අනුව මූලධන වත්කම් අත්පත්කර ගැනීම් රු.**28,908,500** ක් වන අතර**,** එහි වෙනස වන රු.**13,587,696** මුදල මූලධන වත්කම්වලට අමතරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කරන ලද මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා රු.**11,643,451** කින් හා හැකියා වර්ධනය සඳහා වන රු.**1,944,245** කින් සමන්විත වී ඇති බව දන්වා තිබුණි. | |
| (ii) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාලයීය උපකරණ හා පරිගණක උපකරණවල ශේෂය පිළිවෙලින් රු.70,463,867 ක් හා රු.90,907,280 ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂයන් ලෙස එම වටිනාකම් පිළිවෙලින් රු.70,542,267 ක් හා රු.90,828,880 ක් ලෙස රු.78,400 කින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි**.** | ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව කාර්යාල උපකරණ සහ පරිගණක උපකරණවල අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ වශයෙන් ගැනීමේදී රු.78,400 ක මුදලක් වැරදීමකින් අඩුවෙන් සහ වැඩියෙන් සටහන් වී ඇත. මෙය අතපසුවීමකින් සිදුවී ඇති අතර, මෙවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | ආරම්භක ශේෂයන් ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයන් විය යුතු අතර, වෙනසක් වන සෑම අවස්ථාවකම ඒ පිළිබඳ හෙළිදරව් කිරීම සිදුකළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 6 ක සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.1,953,068 ක හිඟ මුදල්වලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 ජනවාරි 01 දිනට පවතින මෙම ආරම්භක ශේෂයන්හි හිඟ සහ දඩ මුදල්ද ඇතුළත් වන අතර, එම ශේෂයන් පොත්වලින් වාර්තාකළ පදනමින්ම ඉවත්කිරීම සඳහා තොරතුරු ලබාදෙන ලෙස ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට දන්වා යවා ඇති බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබූ රු.3,411,990 ක් වූ හිඟ සමථ ආදායම, ආදායම් ප්‍රකාශය (ඒ.සී.ඒ.1) තුළ හිඟ ආදායම් රැස්කිරීම යටතේ දක්වා නොතිබුණු අතර, වර්ෂය තුළ රැස්කළ ලියාපදිංචි කිරීමේ ගාස්තුව ඉහත හිඟ ආදායම් රැස්කිරීමද සමඟ ආදායම් රැස්කිරීම් එකතුව රු.2,170,059,734 ක් ලෙස ආදායම් ප්‍රකාශය තුළ දක්වා තිබුණි. එමෙන්ම නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තුවලට අදාළව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ පසුගිය වර්ෂයන්ට අදාළ හිඟ ආදායම් හා රු.43,770 ක ආදායමෙන් ආපසු ගෙවීම් ඒ.සී.ඒ.1 ආකෘතිය තුළින් හෙළිදරව් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ රු.3,411,990 ක මුදලක් හිග සමථ මුදල් ලෙස අයකර ඇති අතර, අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් එම මුදල් අයකරන අවස්ථාවේදීම ලේඛන ලියාපදිංචි කිරීමේ ආදායමට බැර කරනු ලබන බැවින් නැවත වරක් එම මුදල ඒසීඒ 01 ලේඛනයේ හිඟ ආදායම් රැස්කිරීම යටතේ දැක්වීමට අවශ්‍ය නොවන බව දන්වා තිබුණි.<br>ඉදිරියේදී මෙම වාර්තා කිරීම් පිළිබඳ තොරතුරු ලබාගෙන ලේඛනවලින් ඉවත් කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි.<br>රු.43,770 ආදායමින් ආපසු ගෙවීම් සහිතව ශුද්ධ ආදායම ඒසීඒ 01 ලේඛනයේ සටහන් කර ඇති අතර, ඉදිරියේදී දළ ආදායමින් ආදායම් ආපසු ගෙවීම සහ ශුද්ධ ආදායම වෙන් වෙන් වශයෙන් පෙන්වීමට සටහන් කරගත් බව දන්වා තිබුණි | හිඟ ආදායම් රැස්කිරීම නිසි පරිදි හෙළිදරව් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මු.රෙ.143(2) හා 175(2) ප්‍රකාරව ආදායම් එකතුකිරීමේ නිලධාරියා විසින් අයකරගැනීමට ඇති හිඟ මුදල් එකතුකර ගැනීමට විශේෂ පියවරගන්නා බව සහ අයකරගත නොහැකි සියලුම අයකිරීම් අත්හැර දැමීමට නියෝගයක් ගණන්දීමේ නිලධාරියාගෙන් ලබාගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම වර්ෂ ගණනාවක සිට පවතින හිඟ මුදල් එකතුකර ගැනීමෙහිලා යම් නිලධාරියෙකුගේ නොසැලකිල්ල හෝ අකාර්යක්ෂමතා හේතු වී ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා මු.රෙ. 176 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතු වන්නේ හිඟ ආදායම් ලෙස කාර්යාල විසින් පවත්වාගෙන යන වාර්තාවල සඳහන් වන මුදල සත්‍ය වශයෙන්ම ආදායම්වලට ඇතුළත්කර ඇත්නම් පමණි. එම වැරදි පදනමක් මත පනවා වාර්තාවල පමණක් ඇතුළත්කර ඇති ආදායම් එම ක්‍රමවේදය යටතේම ඉවත් කිරීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණි. මේ පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර චක්‍රලේඛන ද නිකුත් කර ඇති බව දන්වා තිබුණි. | ගිණුම්ගතකර ඇති හිඟ ආදායම් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛයේ උපදෙස් පරිදි 254-01-01-1102 විදේශ ගමන් වැය විෂයය සඳහා ප්‍රතිපාදිත රු. 700,000 ක් සහ 254-01-02-1102 වැය විෂයය සඳහා ප්‍රතිපාදිත රු. 500,000 ක් ලෙස රු. 1,200,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණද, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම මු.රෙ. 66 මගින් 254-01-01-1409 වෙනත් වැය විෂයයට මාරුකරගෙන තිබුණි. | 254-01-01-00-1102 සහ 254-01-02-00-1102 වැය විෂයයන්වල අදාළ කාර්ය සඳහා අවස්ථාවක් දෙපාර්තමේන්තු නිලධාරීන්ට නොලැබීම නිසා එම ප්‍රතිපාදනයන් අත්‍යවශ්‍ය වෙනත් වැය විෂයයන් සඳහා මු.රෙ.66 අනුව මාරුකර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන ඉතිරි කිරීමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 08 ක් යටතේ ගිණුම්ගත කළ යුතු රු.4,718,473 ක වියදම්, වෙනත් වියදම් වැය විෂයය (1409) යටතේ ගිණුම්ගතකර තිබුණි. උපදේශන සේවා වැය විෂයය යටතේ ගිණුම්ගත කළ යුතු රු.450,000 ක් වෙනත් වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට උපදේශන සේවා වැය විෂයයේ ඉතිරිය රු.53,935 ක් වූයෙන් එම රු.450,000 ක මුදල නිවැරදි වැය විෂයය යටතේ ගිණුම්ගත කළේ නම් උපදේශන සේවා වැය විෂයය රු.394,065 කින් ඉක්ම වීමකි. | 2022 වර්ෂයේදී කාර්තු පදනමින් ප්‍රතිපාදන නිදහස් කළ අතර, එම ප්‍රතිපාදනයන් උපයෝජනය අවසන් වූ පසු ගෙවීම් කිරීමට ප්‍රතිපාදන නොමැතිවීම නිසා ගෙවීම්වල අත්‍යවශ්‍යතාවය මත ප්‍රතිපාදන ඇති සුදුසු වැය විෂයයකින් ගෙවීම් කරන ලදී. දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු බාධාවකින් තොරව, කඩිනමින් සහ කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මෙසේ කටයුතුකර ඇති බව දන්වා තිබුණි. ඉදිරියේදී වෙනත් වැය විෂයයකින් වියදම් දැරීමේදී පසුව නිවැරදි වැය විෂයයට බැර කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. උපදේශක සේවා යටතේ සඳහන් කර ඇති රු.450,000 මුදල මෙම වැය විෂයය මඟින් සිදුකර ඇත්තේ උපදේශක සේවා ගෙවීම සඳහා වැය විෂයයක් වෙන්ව නොමැති නිසා බව දන්වා තිබුණි. | නිවැරදිව වියදම් වර්ගීකරණය යටතේ ගිණුම්තැබීමට වගබලා ගත යුතු ය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල පරිශ්‍රය සඳහා සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් මාසය දක්වා ගෙවිය යුතු රු.1,480,000 ක බදු කුලිය වෙනුවෙන් වූ බැරකම, බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2022 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා ගෙවිය යුතු බදු කුලිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීම නිසා බැරකම් හා බැඳීම් ලේඛනයේ ඇතුළත් වී නොමැති බව දන්වා තිබුණි. | වර්ෂයට අදාළ සියලුම බැරකම්, බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |
| (ආ) | වැය විෂයයන් 07 කට අදාළව ප්‍රතිපාදන සීමාව ඉක්මවා එකතුව රු.112,296,712 ක බැරකම්වලට එළඹ තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුවේ සඳහන් මුළු ප්‍රතිපාදන ලබා නොදෙන බැවින්, සියලුම වර්ෂවල ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇති වන බව දන්වා තිබුණි. තවද , අදාළ සියලු වවුචර් පත් සඳහා ගෙවීම් කිරීමට අක්මුදල් නොමැති වීම නිසාද බැරකම් ඇති වන බව දන්වා තිබුණි. | ප්‍රතිපාදිත සීමාව තුළ වියදම් කළමනාකරණය කරගැනීමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂයේ නිරවුල් කරන ලද රු.54,820,889 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50, සහකාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල සහ කළාප කාර්යාලවලින් අදාළ තොරතුරු ලබාගැනීම සහ ලබාදීම නිසිපරිදි සිදුවී නොමැති නිසා මෙම තත්ත්වය වාර්තා වන බව නිරීක්ෂණය කරන අතර ඉදිරියේදී හැකිතාක් නිවැරදිව බැඳීම් සහ බැරකම් ඉදිරිපත් කිරීම සඳහා සුදුසු පියවරගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති වන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාළ සියලුම බැරකම්, බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |
| (ඈ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලියේ සියලු පියවරයන් සිගාස් ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලියේ සියලු පියවරයන් සිගාස් ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර නොමැති අතර, ඉදිරියේදී නිවැරදිව ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි. කෙසේ වෙතත් පෙර වර්ෂවල කටයුතුකර ඇති ආකාරයට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගතව කටයුතු කළ යුතු ය. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඊ-ලැන්ඩ් ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේදී වෙළඳ අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.මිලියන 50 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 13.4 ක් වැයකර උපකරණ මිලදීගැනීම පමණක් සිදුකර තිබුණු අතර, වැඩසටහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 36.2 ක් ලබාදී තිබුණ ද, එයින් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 2.08 ක් පමණක් විය. මේ අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් ලද වත්කම් සහ අනෙකුත් ප්‍රතිපාදන ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය නොකර දෙපාර්තමේන්තුවේ අනෙකුත් කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. | 2021 වර්ෂයේදී අදාළ භාණ්ඩ සහ උපකරණ මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කළද, අදාළ වර්ෂය තුළ රු.මිලියන 13.4 ක උපකරණ පමණක් ලබාගැනීමට හැකිවී ඇති බව දන්වා තිබුණි. 2021 වර්ෂය අවසානයේ එම භාණ්ඩ ලබාගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ වල (2103) ඉතිරිව තිබූ ප්‍රතිපාදන විශේෂ තැන්පතු ගිණුමට මාරුකරන ලද අතර, 2021 වර්ෂයේ ඇණවුම් කළ භාණ්ඩ ලබාගැනීම සඳහා 2022 වර්ෂයේදී 254-01-02-2103 වැය විෂයය සඳහා රු.මිලියන 36.2 ප්‍රතිපාදනයක් ලබා දුන්නද, 2022 වර්ෂයේ එම මුදලින් උපයෝජනය කිරීමට හැකි වූයේ රු.2,080,000 ක් පමණක් බව දන්වා තිබුණි. | වෙනත් ආයතන මඟින් ලබා දෙන ප්‍රතිපාදිත මුදල් ප්‍රතිපාදිත කාරණය සඳහාම වැය කිරීමට වගබලා ගත යුතු ය. |

## 2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන අතර, එම පද්ධතියේ සඵලදායිතාව පිළිබඳව කලින් කලට සමාලෝචනය සිදුකර අභ්‍යන්තර විගණකගේ සම්බන්ධීකරණය යටතේ පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් කර ඉදිරිපත් කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | XXIV වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය | **932,696** | වර්ෂ 07 සිට වර්ෂ 28 ක කාලපරාසයක් තුළ නිලධාරීන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ණය අයකරගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීමත්, වැන්දඹු අනත්දරු වැටුපෙන් අයකිරීමේ හැකියාව ද ගැටළු සහගතවීමත්, මෙයට හේතුවී ඇති අතර, තවදුරටත් අධ්‍යයනය කර අදාළ ණයශේෂයන් අයකරගැනීමට ක්‍රමයක් නොමැති බව තහවුරු වුවහොත්, මෙම ණයශේෂයන් කපාහැරීම සඳහා පියවරගන්නා බව දන්වා තිබුණි. | යොමුගත වගන්තියට අනුකූල විය යුතු ය. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මු.රෙ. 571 | | වර්ෂ දෙකක් ඉක්මවා ඇති ඉකුත් තැන්පතු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙළ කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසියට අනුකූල විය යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | මු.රෙ. 571(3) | වසර දෙක ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | විදුලිජනක යන්ත්‍ර මිලදීගැනීම සඳහා රඳවා තබා තිබූ රු.2,173,898 ක මුදල නිදහස් කර ඇති අතර, ඉතිරි මුදල්ද ගෙවීම් කිරීමට නොහැකි නම් රජයේ ආදායමට බැර කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි. | යොමුගත රෙගුලාසිය ට අනුකූල විය යුතු ය. |
| (iii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ 11.1ඡේදය | දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ඌණතා, අතිරික්තතා හා භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අදාළ නියෝග ක්‍රියාත්මක කිරීම බොහෝ දුරට අවසන් කර ඇති බවත්, එම භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් 2021 වර්ෂයද ආවරණය වන බවත්, දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ට අනුකූල විය යුතු ය. |
| | 13.2ඡේදය | අපහරණය කළ යුතු පාවිච්චි කළ නොහැකි වාහන 05 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. | අපහරණය සඳහා හඳුනාගනු ලැබූ වාහන ආරක්ෂක අමාත්‍යාංශයට හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ට අනුකූල විය යුතු ය. |

(iv) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

| | | | | |
|---|---|---|---|---|
| | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 චක්‍රලේඛයේ 07 ඡේදය | චක්‍රලේඛය පරිදි අර්ධ වාර්ෂික ආදායම් වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ද පිටපතක් යැවීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ට අනුකූල විය යුතු ය. |
| (v) | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ 2022 ඔක්තෝබර් 21 දිනැති අංක 15/2022 චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 31 කින් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්තා 115 ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යොමුකර නොතිබුණි. | සමහර කාර්යාල විසින් එම වාර්තාව ලබාදීම ප්‍රමාද කර ඇති බැවින් වාර්තා ලබාදිය යුතු ආකාරය පිළිබඳ චක්‍රලේඛන මඟින් උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමටත් අදාළ වාර්තා ප්‍රමාදයකින් තොරව ලබාදෙන ලෙසත් දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ට අනුකූල විය යුතු ය. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරීන් 06 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබූ රු.129,000 ක අත්තිකාරම් මුදල් අදාළ කාර්යය සඳහා වැය නොකර දින 20 සිට මාස 05 ක් වැනි කාල පරාසයක් අතරඳවා තබාගෙන මුළු මුදලම ආපසු පියවා තිබුණි. | අදාළ කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් මුදල නිරවුල් කරන ලෙස උපදෙස් ලබා දී ඇතත්, අදාළ අක්මුදල් නිරවුල් කර නොමැති බව නිරීක්ෂණය කරන අතර ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් නිරවුල් කරගැනීමට පියවරගන්නා බව දන්වා තිබුණි. | කාර්යය නිමවූ විගසම අත්තිකාරම් පියවීමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ.371 (2) (අ) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාගන්නා නිලධාරියෙකු අදාළ කාර්යය නිමකළ විගස එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් වෙත ලබා දී තිබූ රු.909,070 ක අතුරු අග්‍රිම 15 ක් පියවීමට දින 13 සිට මාස 04 ක් දක්වා වූ කාලපරාසයක් ගෙන තිබුණි. | විගණන විමසුමේ සඳහන් සියලු නිලධාරීන්ගෙන් ප්‍රමාදයට හේතු විමසා ඇති අතර, ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් නිරවුල් කරගැනීමට පියවරගන්නා බව දන්වා තිබුණි. | අත්තිකාරම් නියමිත කාලය තුළ පියවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 2.8 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 15 දින වන විට පොදු තැන්පත් ගිණුමේ තිබූ රු.79,675 ක හඳුනා නොගත් තැන්පතු 2023 මාර්තු වන විටත් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ බැංකු ගිණුමට තැන්පත් කර තිබූ එම මුදල් පසුව ආපසු ගෙවීමට සිදු වුවහොත් ගෙවීමට තැන්පතු ගිණුමේ තැන්පත් කර ඇති බව දන්වා තිබුණි. මෙම චෙක්පත් පිළිබඳව නැවතත් බැංකුවෙන් විමසා බලා තොරතුරු ලබාගැනීමට නොහැකි වුවහොත් රජයේ ආදායමට බැර කිරීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | පොදු තැන්පත් ගිණුමේ හඳුනා නොගත් තැන්පතු ඇතිවීමට හේතුව සොයාබැලීමට කටයුතු කළ යුතු ය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වූ රු.මිලියන 17.5 ක ඇස්තමේන්තුගත වැඩසටහන් දෙකක් වෙනුවට රු.මිලියන 13.4 ක් වැයකර අනුමත ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ වෙනත් වැඩසටහන් 03 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දී පැවැත්වීමට | රටේ පැවති අයහපත් සමාජයීය තත්ත්වයත්, ප්‍රධාන අවශ්‍යතාවයන් සඳහා මූලිකත්වය දීමත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වියදම් සීමා කිරීමේ චක්‍රලේඛනයත් නිසා විගණන විමසුමේ තත්ත්වය ඇතිවී ඇති බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |

සැලසුම් කර තිබුණු රු.මිලියන 1.7 ක තවත් පුහුණු වැඩසටහන් 39 කින් 05 ක් පමණක් පවත්වා ඉතිරි ප්‍රතිපාදන අනුමත ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ වෙනත් වැඩසටහන් සඳහා යොදවා තිබුණි.

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු මාර්ගගතව සිදුකිරීමේ අරමුණින්, ඊ - ඉඩම් (e - Land) ව්‍යාපෘතියට අදාළ පත්ඉරු පරිලෝකනය කිරීමේ කටයුතු 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර පෞද්ගලික ආයතන දෙකක් විසින් දෙපාර්තමේන්තුව යටතේ ඇති ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 කින් 20 කදී හා 2018 වර්ෂය දක්වා පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණු අතර එම කාර්යාල 20 හි ද පරිලෝකනය කර තිබූ පත්ඉරු ප්‍රමාණය 11,595,197 ක් පමණක් විය. 2018 වසරෙන් පසු ලියාපදිංචි කරන ලද පත්ඉරු පරිලෝකනය කිරීම සිදුකර නොතිබීම හා ගිවිසුම් ගත වූ සමාගම් නියමිත ඉලක්කයන් ඉටුකිරීමට අපොහොසත්වීම මත ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ අරමුණු ඉටුකර නොතිබුණි. | 2018 වර්ෂය වනතෙක් කාර්යාල 20 ක පත්ඉරු පරිලෝකන කටයුතු සිදුකර ඇති අතර මාර්ගගත ක්‍රමයට එකී පත්ඉරු පරීක්ෂා කිරීමේදී පැන නැගුණු ගැටළු කිහිපයක් නිසාවෙන් අදාළ මෘදුකාංගය අදියර III කින් නිවැරදිව සකස් කිරීමට කටයුතු කරගෙන යනු ලබන බව දන්වා තිබුණි. | වසර ගණනාවක සිට ක්‍රියාත්මක වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල කඩිනමින් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කටයුතුවලට හා වෙනත් පාර්ශවයන්ගේ අවශ්‍යතාවයන් සඳහා, ඉඩම් ලේඛන පරීක්ෂා කිරීමේ කටයුතු මාර්ගගතව සිදු කිරීමට පහසුකම් සැලසීමට හා ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක | මෘදුකාංගය ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු දැනට ඉටු කරමින් පවතින බවත්, වැඩසටහන සඳහා ලැබුණු යන්ත්‍ර සහ උපකරණ මුලින්ම මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා තෝරාගත් කාර්යාල 20 කට හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට ද ඊට | වසර ගණනාවක සිට ක්‍රියාත්මක වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල කඩිනමින් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

කිරීමට සැලසුම් කළ ඊ-ඉඩම් (e - Land) පරිසණක වැඩසටහන ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු 2016 වර්ෂයේ සිට සිදුකළ ද, මෘදුකාංගයේ පැවති ගැටළු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එයින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවී නොතිබුණු අතර, ඒ වන විටත් කොළඹ හා හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට පමණක් මෙම වැඩසටහන හඳුන්වා දී තිබුණි. කෙසේ වෙතත් මෙම වැඩසටහන වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ලබා දී තිබූ යන්ත්‍ර, උපකරණ හා අනෙකුත් උපාංගවල වටිනාකම රු. මිලියන 98.7 ක් විය. මේවා ප්‍රධාන කාර්යාලයේ අංශ අතර හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල අතරේ බෙදාහැර තිබුණ ද, එයින් ක්‍රියාත්මක කර තිබූ කොළඹ සහ හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල මුල් අදියර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

අමතරව ප්‍රධාන කාර්යාලය වෙත ද ලබා දී ඇති බව දන්වා තිබුණි.
මෘදුකාංගය අදියර තුනකින් අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, I වන අදියරයෙහි නවීකරණ කටයුතු මේ වන විට අවසන් කර ඇත. 2023 වර්ෂයේ I වන අදියර නියමු කාර්යාල 7 ක ස්ථාපනය කිරීමට අපේක්ෂිතය. එමෙන්ම දැනට II වන අදියරයේ කටයුතුද මේ වසර අවසානවීමට ප්‍රථම අවසන් කිරීමට නියමිත අතර දැනට කාර්යාල වෙත ලබා දී ඇති උපකරණ හා අනෙකුත් උපාංග ප්‍රයෝජනයට ගනිමින් ඉහත නියමු කාර්යාල 7 හි මෙම වසරේ අවසානයට ප්‍රථම මෘදුකාංගයෙහි කටයුතු ආරම්භ කිරීමට සැලසුම් සකස්කර ඇති බව දන්වා තිබුණි.

(ඇ) රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ උපත්, විවාහ සහ මරණ සම්බන්ධ සිවිල් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙන යාමේ අරමුණෙන් 2010/2011 වර්ෂ වන විට ICTA ආයතනයේ මැදිහත්වීම මත නිර්මාණය කළ මෘදුකාංග පද්ධතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද මෙමඟින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.
ඒ අනුව දිවයිනේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙම වැඩසටහන පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන මත ලැප්ටොප් පරිගණක හා උපාංග 331 ක් බෙදාහැර තිබුණ ද, දිස්ත්‍රික්ක

2008 වර්ෂයේදී සකස් කර ඇති ඊ - ජනගහන ලේඛන වැඩසටහනෙහි 2017 වර්ෂයේ සිට දත්ත පද්ධතියේ සේවා හා නඩත්තු කටයුතු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් භාරගෙන 2019 වර්ෂය දක්වා දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සිදුකරන ලද නමුත්, 2019 නොවැම්බර් සිට එම වැඩසටහන ක්‍රියාත්මක නොවුණු බව දන්වා තිබුණි.
පසුව 2021.01.01 වන දින හා එදිනට පසු සිදු වූ උපත් හා මරණවලට අදාළ දත්ත ඇතුළත් කිරීමටත්, 2021.01.01 වන දින හා එදිනට පසු උපන් දරුවන් සඳහා ජාතික උප්පැන්න සහතිකය ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන නියමු කාර්යාල 06 ක් හරහා සිදුකරමින් පවතින බවත්, දැනට සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ක්‍රියාත්මක

වසර ගණනාවක සිට ක්‍රියාත්මක වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල කඩිනමින් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය.

| | |
|---|---|
| 14 කට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 44 ක 2021 වසරට අදාළව දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණේ ලියාපදිංචි කළ උපත් 53,739 කින් 01 ක් පමණක් හා ලියාපදිංචි කළ මරණ 23,467 කින් 04 ක් පමණක් විය. එසේම විවාහ පිළිබඳ තොරතුරු කිසිඳු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පවත්වාගෙන ගොස් නොතිබුණි. | වන e-BMD ව්‍යාපෘතිය යටතේ 1960 සිට 2022 දක්වා ලියාපදිංචි කරන ලද උප්පැන්න, විවාහ සහ මරණ සහතික පරිලෝඛනය කර ඒ හරහා සහතික පිටපත් නිකුත් කිරීම ද සිදුකරනු ලබන බවත් දන්වා තිබුණි. මේ වන විට 2021.01.01 සිට 2023.06.13 දින දක්වා ඇතුළත් කළ උපත්වලින්, දෙමාපියන්ගේ තහවුරුව ලබාගත් 101,014 ක දත්ත මුද්‍රණය කිරීම සඳහා පද්ධතියට ඇතුළත් කර අනුමත කර ඇති බවත් ඊ - ජනගහන ලේඛන වැඩසටහන හරහා විවාහ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මේ වන තෙක් ආරම්භ කර නොමැති බව දන්වා තිබුණි. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 4.2.1. ප්‍රකාරව අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදනයන් ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය ද ඇතුළත් එවැනි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2022 හා 2023 වර්ෂ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ඇති අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හි ආකෘතිය අනුව වසර තුනක තොරතුරු සඳහන් කිරීම සඳහා ඉඩක් වෙන්කර නොමැති බව දන්වන අතර, ඉදිරියේදී විගණන අංශ සමග සාකච්ඡා කර නිවැරදි කරගැනීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1. ආ (II) හා (IV) ප්‍රකාරව ප්‍රසම්පාදනයන්ට අදාළ ලංසු කැඳවීමේ ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් සමාලෝචනය කර අනුමත කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,542,200 කට මිලදීගත් මුද්‍රණ යන්ත්‍ර 38 ක ප්‍රසම්පාදනයේ දී සහ හිමිකම් අංශය සඳහා කාර්යාල | ඉහත ප්‍රසම්පාදනයට අදාළව 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 ආ (ii) හා (iv) ප්‍රකාරව ලංසු ලේඛන තාක්ෂණ ඇගයුම් කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කර නොමැති අතර මේ වන විට එවැනි ප්‍රසම්පාදනයන් සඳහාද අදාළ අනුමැතීන් ලබාගැනීමට කටයුතුකර ඇති බව දන්වා තිබුණි. | මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| උපකරණ ප්‍රසම්පාදනයේ දී එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | | |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1. ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී රු.1,014,000 කට සෙවුම් මේස 10 ක් සහ බැඳුම් මේස 07 ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදනයේ දී ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොමැති බව සත්‍යයක් බව දන්වා තිබුණි. අනෙකුත් ප්‍රසම්පාදනවලදී මීට අනුකූලව කටයුතුකර ඇති බව දන්වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති ප්‍රසම්පාදනයේ සියලු භාණ්ඩ ලැබී ඇති බව දන්වා තිබුණි. | මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

**3.4 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පැවති වාහන දෙකක් පෙර වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ අනතුරුවලට භාජනය වීමෙන් සිදුවූ අළුත්වැඩියා වියදම රු.4,089,400 ක් වූ අතර, මෙම අනතුරු සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) මු.රෙ.104(1)(අ) ප්‍රකාරව, පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එම ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැනගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. | අංක KA-8957 දරන වාහනයේ සිදුකළ මූලික පරීක්ෂණ වාර්තාව මේ වන විට ලැබී ඇති අතර, ඉදිරි කටයුතු සිදු කිරීමට පියවරගෙන ඇති බවත් අංක PH-0524 දරන වාහනයේ අදාළ පරීක්ෂණ සිදුකර ඇති නමුත්, එම වාර්තාව තවම ලැබී නොමැති බැවින් එය ලබාගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වන අතර අදාළ වාර්තා ලද පසු ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මු.රෙ.104(3) හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 2.5 ඡේදය ප්‍රකාරව, හානියක් සිදු වී ඇති විට ඒ සම්බන්ධ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් පොදු 283 ආකෘති පත්‍රයේ ප්‍රාරම්භක වාර්තාවක්ද, තුන්මසක් ඇතුළත මු.රෙ.104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් පොදු 284 ආකෘතියේද නිසිපරිදි සම්පූර්ණ කර විගණකාධිපතිට පිටපතක් සහිතව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ 104(3) ප්‍රකාරව, පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක්/ ප්‍රාරම්භක වාර්තාවක් හෝ පූර්ණ වාර්තාවක් සිදු කිරීමට නොහැකි වූයේ අදාළ වාහන දෙකෙහි අළුත්වැඩියාවන්ට අවශ්‍ය අමතර කොටස් සොයා ගැනීමට අපහසු වූ බැවින් අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වූ බැවින් බව දන්වන අතර කෙසේ වෙතත් අනතුර සිදුවූ වහාම මු.රෙ. අනුව වාර්තා ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (iii) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව, වාහනයක අභ්‍යන්තර අළුත්වැඩියා කිරීමක දී වාහනයේ කොටස් ගැලවූ ගරාජය විසින් ඉදිරිපත් කරන මිල ගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ ආයතනයක, සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගත යුතු වුවත්, ඉහත අළුත්වැඩියා ඇස්තමේන්තු සඳහා එවැනි වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | 30/2016 චක්‍රලේඛය අනුව ආයතන මඟින් මිල ගණන් ලබාගෙන සිදුකරනු ලබන අළුත්වැඩියාවන්වලදී යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලබාගෙන අදාළ අළුත්වැඩියාවන් සිදු කිරීම අනිවාර්යෙන් සිදුකරන අතර, එසේ සිදුකර නොමැති වාහන අනතුරු සම්බන්ධයෙන් මින් ඉදිරියේදී එම අඩුපාඩු සහ අත්හැරීම් වලක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (iv) | ඉහත හානි සිදුවී වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත්, එම වාහනවල අළුත්වැඩියාවන් නිමකර ඇති බවට 2023 අප්‍රේල් 30 දින වන විටත් විගණනය වෙත සනාථ නොවුණි. | අළුත්වැඩියා කටයුතු සිදු කිරීම ප්‍රමාද වූයේ අදාළ වාහනවලට අවශ්‍ය අමතර කොටස් වෙළඳපොළ තුළ නොතිබූ නිසා බව දන්වා තිබුණි. නමුත් මේවන විට අංක KA-8957 වාහනය සඳහා රු.1,694,450 මුදලක ඇස්තමේන්තුව රක්ෂණ සංස්ථාවෙන් ගෙවීමට එකඟ වී ඇති බව දන්වා තිබුණි. අංක PH-0524 වාහනයේ ඇස්තමේන්තුව අදාළ | අළුත්වැඩියාවන් අප්‍රමාදව සිදුකර වත්කම්වලට වන හානිය අවම කරගත යුතු ය. |

| | | |
|---|---|---|
| | ගරාජය මහින් මේ වන විට ලබා දී ඇති අතර එම ඇස්තමේන්තු වටිනාකම වන රු.2,439,950 ක මුදල රක්ෂණ සංස්ථාව මහින් ලබාගැනීම සඳහා මේ වන විට රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි. | |

**3.5 කළමනාකරණ දුර්වලතා**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මු.රෙ.143(2) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවර ගෙන නොතිබුණි. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් පනවනු ලබන සමථ මුදල් පැනවූ අවස්ථාවේදී වාර්තා ගත කිරීමක් පමණක් සිදුවන බවත්, අදාළ සමථ මුදල් ලැබෙන අවස්ථාවේදී ගිණුම්ගත වන බවත් දන්වා තිබුණි.<br>මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතු වන්නේ හිඟ ආදායම් ලෙස කාර්යාල විසින් පවත්වාගෙන යන වාර්තාවල සඳහන් වන මුදල සත්‍ය වශයෙන්ම ආදායම්වලට ඇතුළත් කර ඇත්නම් පමණි. එම වැරදි පදනමක් මත පනවා වාර්තාවල පමණක් ඇතුළත් කර ඇති ආදායම් එම ක්‍රමවේදය යටතේම ඉවත් කළ යුතු බව දන්වන අතර, මේ පිළිබඳව දෙපාර්තමේන්තුවේ අංක 11/2019 සහ 2019 ජූලි 23 දිනැති චක්‍රලේඛනය සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක 15/2022 සහ 2022 ඔක්තෝබර් 21 දිනැති චක්‍රලේඛනයන් නිකුත් කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසිවලට සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නොතාරිස්වරුන් විසින් ඉඩම්වලට බලපාන ඔප්පුවක් ලිවීමේදී නොතාරිස් ආඥා පනතේ 31 වගන්තියේ සඳහන් රීති නිසි පරිදි පිළිනොපැදීම හා ඒවාට අනුකූලව ක්‍රියා නොකිරීම හේතුවෙන් ඉඩම් ඔප්පු ලියාපදිංචිය ප්‍රමාදවන අවස්ථා නිරීක්ෂණය වූ අතර නියැදි විගණන පරීක්ෂාවට ලක් වූ කොට්ටාව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ ඔප්පු/ලේඛන 379 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පවතින අඩුපාඩු හේතුවෙන් එම ලේඛන ලියාපදිංචි නොකර රපෝර්තු ලේඛනයට ඇතුළත් කර අදාළ නොතාරිස්වරුන් ඉඩම් ලියාපදිංචි කාර්යාලය වෙත කැඳවා අඩුපාඩු නිවැරදි කරවා ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලබන අතර, නොතාරිස්වරුන්ට විරුද්ධව නීත්‍යානුකූල පියවරගැනීමට මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන නොමැත. මෑතකදී 1907 අංක 01 දරන නොතාරිස් ආඥා පනතේ 31 වන වගන්තියේ 26 වන රීතිය , 2022 අංක 31 දරන නොතාරිස් සංශෝධන පනත මඟින් සංශෝධනය කර ඇති බව දන්වා තිබුණි. ඒ අනුව එම රීතිය උල්ලංඝණය කරන නොතාරිස්වරයකුට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත නොතාරිස් ධුරයේ කාර්යන් ඉටුකිරීම අත්හිටුවිය හැකි බව දන්වා තිබුණි. | ආඥා පනතේ රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2812 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 3821 ක් වූ බැවින් අතිරික්ත හා ඌන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 1272 ක් හා 263 ක් විය. | විගණන විමසුමේ අතිරික්ත කාර්ය මණ්ඩලය ලෙස සඳහන් වන්නේ සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව වන අතර, ඌන කාර්ය මණ්ඩලය ලෙස දැක්වෙන්නේ අනෙකුත් සේවාවල අනුමත සේවක සංඛ්‍යාව අතරින් පුරප්පාඩු සංඛ්‍යාව බව දන්වා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගැනීම් සිදුකිරීමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංවර්ධන නිලධාරීන් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 400 ක් වුව ද, දෙපාර්තමේන්තුවට බඳවාගෙන තිබුණු තථ්‍ය කාර්ය මණ්ඩලය 1672 ක් වූ බැවින් අතිරික්ත නිලධාරීන් සංඛ්‍යාව 1272 ක් වූ අතර මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලය වන 1272 ක් වන සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව වැඩිකරගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් RG/AB/02/05/25(මු.රෙ.II) හා 2021.09.24 දිනැති ලිපිය මඟින් අනුමැතිය ඉල්ලා ඇති අතර, ඒ අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇති බව දන්වා තිබුණි. | විධිමත් අනුමැතියක් ලබාගැනීමට ක්‍රියාකළ යුතු ය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් ද ඇතුළත්ව තනතුරු 18 ක අනුමත නිලධාරීන් 263 ක ඌනතාවයක් පැවතුණි. | ඌන කාර්ය මණ්ඩලය ලබාගැනීම සඳහා ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත Pacis මෘදුකාංගය ඔස්සේ දැනුවත් කරනු ලබන අතර, රෙජිස්ට්‍රාර් සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බඳවාගැනීමේ පරිපාටිය අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් නොමැතිවීම, නිලධාරීන් විශ්‍රාම යෑම හා ස්ථාන මාරුවීම් නිසා නිලධාරීන් 263 දෙනෙකුගේ ඌනතාවයක් පවතින බව දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතු ය. |